# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2475/24 - 2026 පෙබරවාරි මස 11 වැනි බදාදා - 2026.02.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* : DIVE/LND/ACQUI/5/10.
*ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය* : 4-3/11/2022/CEB/72.

මහජන කටයුත්තක් (බලශක්ති පද්ධති විශ්වසනීයව සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ ද.වෝ. 220/132 වහරු උපපොළ ඉදිකිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම) සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කර ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 869 වීරඹුගෙදර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නාවාහේනේගෙදර ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් වෙනුවට කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජ්‍යොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක 420267 හා 2025.12.09 දිනැති පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 9.8454ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

ඉඩමේ නම: පඹේවත්ත, පඹේවෙල, නේත්‍රන්මුල්ල වත්ත *හෙවත්* මැල්ලගොල්ලේ හේන; ප්‍රමාණය: හෙක්. 9.8454 (අක්කර 24, රූඩ් 01, පර්චස් 12.6)

*උතුරට*: මු. පි. 895හි 12 වෙනි බිම් කැබැල්ලේ කොටසක්, හි. පි. 220109හි කොටසක් සහ ප්‍රාදේශීය සභා මාර්ගය; *නැගෙනහිරට*: ප්‍රාදේශීය සභා මාර්ගය, ඇළ, මු.පි.කු. 1755හි 1 වෙනි බිම් කැබැල්ල සහ මු.පි.82හි 4 (හි.පි. 267759) වෙනි බිම් කැබැල්ලේ කොටසක්; *දකුණට*: ඇළ, මු.පි.කු. 1755හි 1 වෙනි බිම් කැබැල්ල, මු. පි. 82හි 4 (හි.පි. 267759) වෙනි බිම් කැබැල්ලේ කොටසක්, මු.පි. 82හි 8 (හි.පි. 256561) වෙනි බිම් කැබැල්ලේ කොටසක් සහ මු.පි.කු. 1092හි 22, 23, 26, 27, 30, 31 වෙනි බිම් කැබලි; බටහිරට: මු.පි.කු. 1092හි 22, 23, 26, 27, 30, 31 වෙනි බිම් කැබලි සහ මු.පි. 895හි 12 වෙනි බිම් කැබැල්ලේ කොටසක්

වර්තමාන ඉඩම් පරිහරණය: වත්ත, අවුරුදු 20-25ක් පමණ වයසැති පොල් වගාවක් සහ ස්ථිර ගොඩනැගිල්ලක් ඇත.

හිමිකම් කියන්නා: සීමාසහිත එස්. කේ. ඉන්වෙස්ට්මන්ට් සොලියුෂන්ස් පුද්ගලික සමාගම, අංක 96, පුත්තලම් පාර, කුරුණෑගල.


1A - G 46281 – 13 (2026/02)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026.04.27 දින පෙ. ව. 10.00ට වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2026.04.27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුය.

**ජේ. ජී. ජී. අයෝමි වීරවර්ධන,**
ප්‍රාදේශීය ලේකම්,
වීරඹුගෙදර.

2026 පෙබරවාරි මස 10 වැනි දින,
වීරඹුගෙදර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02 - 0097